Page 1 Augu-Sep 2012.qxd 24/09/2012 06:47 Page 1


# ලංකාවිත්ති
# LANKA VITHTHI

මවත් මව්බිමත් ස්වර්ගයට වඩා උතුම්ය!
Mother and Motherland are nobler than Heaven



FOR FREE CIRCULATION
නොමිලේ බෙදාහැරීම පිණිසයි
VOLUME 15
NUMBER 05

ලොව කොතැනවුව වෙසෙන සිංහලයින් සඳහා ලන්ඩනයේ මුද්‍රිත සිංහල පුවත් පත
SINHALA LANGUAGE NEWSPAPER PUBLISHED IN LONDON FOR THE SINHALA READERS WHEREVER THEY ARE.

AUGUST/ SEPTEMBER 2012 අගෝස්තු / සැප්තැම්බර් (බු:ව: 2556 නිකිනි / බිනර මාස) http://www.lankaviththi.org


# ඔලිම්පික් පාඩම්



♦ සංජය විමලරත්න විසිනි

**ප**සුවුණු ජූලි මස 27 සිට අගෝස්තු 12 දක්වා ලන්ඩන් නුවර පැවැත්වුණු 2012 ඔලිම්පික් තරඟාවලිය යනු සෑම වසර හතරකට පසු පැවැත්වෙන ජාත්‍යන්තර වශයෙන් වැදගත් මහා ක්‍රීඩා උළෙලයි. මෙම ලන්ඩන් නගරයේ බිහිවුණු සහ ප්‍රකාශයට පත්වන පුවත්පතක් වශයෙන් අප **ලංකාවිත්ති ද** මෙම ලන්ඩනයේ වසර හැටහතරකට පසු දෙවන වරට පැවැත්වුණු මෙම මහා ක්‍රීඩා උළෙල දෙස බලා සිටියේ ඉමහත් උනන්දුවකිනි. මක්නිසාද යත් ඔලිම්පික් යනු නිකම්ම ක්‍රීඩා උළෙලක් නොව එය රටක ජනජීවිතය, ජනසමාජය, ආර්ථිකය පුද්ගල ආකල්ප සහ චිත්ත ධෛර්‍ය්‍යය ආදියට ඉමහත් බලපෑමක් කර සාමාජීය වශයෙන් වෙනස් කම් ඇතිකරන්නට නිසැකවම සමත්වන බැවිනි.

එබැවින් මේ සියල්ල දෙස අප බලන ආකාරය සහ අපට පෙනෙන පසුතලයද අප පාඨකයින් වෙත විස්තරාත්මකව දක්වන්නට සිතුවෙමු. එසේ මෙහි අභ්‍යන්තරය විදහාදක්වන්නේ විශේෂයෙන් මෙවැනි දැවැන්ත කාර්‍ය්‍යයක් කෙසේ සංවිධානය කළේද, ක්‍රියාත්මක කළේද, ලැබූ ප්‍රතිඵල මොනවාද? යන්න දැනගැන්මෙන් අප මව්බිම ශ්‍රීලංකාවේ අනාගත ක්‍රීඩා හා සමාජ වර්ධනයට, රටේ උන්නතියට සහ අචල ජනතා අධිෂ්ටානයක් ගොඩ නැගීමට ආධාරකයක් වනු ඇතැයි යන ස්ථිර කල්පනාවෙනි.

## ඔලිම්පික් ඉතිහාසය කෙටියෙන්

ඔලිම්පික් තරඟ ක්‍රිස්තු පූර්ව 7 වන ශතවර්ෂයේ දී ග්‍රීසියේ ආරම්භ වූයේ හෙරකල්ස් (හර්කියුලීස්) නම් එහි පාලක යාගේ සමයේ එම රාජ්‍යයේ විවිධ ප්‍රාන්තයන්හි වෙසෙන රණශූරයින්ගේ ශාරීරික හැකියාවන්, කඩු හා දුනු ශිල්ප, අශ්වරථ ධාවන තරඟ හා මල්ලව පොර ආදී විවිධ අංශයන් හි තත්වය කෙසේ දැයි පරීක්ෂාකිරීමක් වශයෙනි. එසේම එම තරඟ මාලාව සියස් නම් දෙවියන්ට කරන මහා පූජෝපහාර යක් වශයෙන් ද ග්‍රීකයෝ සැලකූහ. ඔලිම්පියා යනු එම තරඟ පැවැත්වූ සුන්දර මිටියාවතේ නමයි.

ඔලිම්පික් තරඟ මෙසේ ග්‍රීසියේ 2 වන ශත වර්ෂය දක්වා පැවැත්වෙමින් තිබියදී රෝමන්වරු ග්‍රීසිය ආක්‍රමණයකර එය අල්ලා ගත්හ. දෙවිවරුන්ට කිසිම විදියකින් පුදපූජා පැවැත් වීම ඔව්හු තහනම් කළෝ ය. එනිසා ඔලිම්පික් තරඟ පැවැත් වීම ද එතනින් ම අහෝසි වී ගියේ ය.

තවත් අවුරු 1500 කට පසු කැලෑවැදී කාටත් අමතකව ගොස් තිබුණු ඔලිම්පික් ක්‍රීඩා තරඟ යළිත් පණගසා ආවේ ය. එහි පසුබිම මෙසේ ය.

ප්‍රංශයේ වංශාධිපතියෙකු වූ පියරේ ඩි කෝබර්ටිං සහ ග්‍රීකයෙකු වන දිමිට්‍රියස් විකීලියස් යන දෙදෙන එකතුව උනන්දුවීමේ හේතුවෙන් ඔලිම්පික් තරඟ පැවැත්වීම යළි ආරම්භ වීය. කෝබර්ටිංගේ මතය වූයේ ක්‍රීඩාව ලොව විවිධ ජාතීන් අතර එකමුතුබව සහ සාමය ඇතිකරීම පිණිස උපයෝගී කරගතහැකි මහත් බලවේගයක් බවයි. යට පත්ව තිබුණු ඔලිම්පික් ක්‍රීඩා තරඟ නැවත කෙසේ හෝ ආරම්භකිරීමෙන් එය සාක්ෂාත් කරගත හැකි බව ඔහු තරයේ විශ්වාස කළේය. මුලින් අසාර්ථක වෑයම කින් පසු අවසානයේ ඔහුගේ අදහස සාර්ථක වන ලකුණු පෙනිණ.

1894 දී ආධුනික ක්‍රීඩකයින් සඳහා පැවති ජාත්‍යන්තර සමුළුවකදී නැවත ඔලිම්පික් ලොවට හඳුන්වා දියයුතුය යන අදහස පියරේ කෝබර්ටිං ඉදිරිපත් කළේ ය. ඔහුගේ එම මතය එම සමුලුවේ ඒක මතිකව පිළිගැනුණි. ජාත්‍යන්තර ඔලිම්-පික් කමිටුව International Olympic Committee (IOC) පිහිටවූයේ එදා ය. දිමිත්‍රියස් විකේලා ඔලිම්පික් කමිටුවේ ප්‍රථම සභාපති ලෙස තෝරාගන්නා ලදී. ඔලිම්පික් උපන් ඇතන්ස් නගරයෙන්ම නව ඔලිම්පික්ද පටන්ගත යුතුයයි ද එදා තීරණය විය.

ඒ අනුව 1896 දී ග්‍රීසියේ ඇතැන්ස් නගරයේ පැනතනියක් (Panatheniac Stadium) නම් ක්‍රීඩාංගනයේ දී නව ඔලිම්පික් ක්‍රීඩා තරඟ පැවැත්විණ.

පැරණි ඔලිම්පික් යුගයේ භාවිතා වූ මූලධර්ම සහ පරමාර්ථ නව ඔලිම්පික් සඳහාද භාවිතා කරන්නට තීරණය වූ අතර අළුත් අදහස් ද එකතු විය. ඉන් එකක් නම් ලොව පුරා සිටින ක්‍රීඩාවට හිතැති ශාරීරික ආබාධ සහිත අය වෙනුවෙන් වෙනම පැරලිම්පික් තරඟ සමාන්තරව ඒ විදියටම පැවැත්විය යුතුය යන්නයි. සමාන්තර හෙවත් පැරලල් ඔලිම්පික් යන යුගල වචන කෙටිවී පැරලිම්පික් යන වචනය භාවිතයට ආවේය.

ලන්ඩන් පැරලිම්පික් පසුවූ අගෝස්තු 24 වන දා සිට මේ සැප්තැම්බර් 9 දා (ඊයේ) දක්වා නැගණහිර ලන්ඩනයේ ස්ට්‍රැට්පර්ඩ් පෙදෙසේ ඉදිකරන ලද මහා ඔලිම්පික් ක්‍රීඩාංගනයේදී පැවැත්විණ.

## ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව (IOC)

ජාත්‍යන්තර ඔලිම්පික් කමිටුව (IOC) මේ සියල්ලේ වගකීම සහ මූලිකත්වය දරයි. මීළඟට ඔලිම්පික් පවත්වන රට සහ ස්ථානය තීරණය කරන්නේ ඒ කමිටුවයි. දැනට පවත්වන තරඟමාලාව අවසන් වන්නටත් පෙර ඔව්හු ඊළඟට පවත්වන රටට වගකීම පවරති. ඔලිම්පික් සඳහා සුදුසුකම් ලැබීම ඉතා අමාරු එමෙන්ම ඉතා තරඟකාරී දෙයක් වෙයි. එය හැම අතින්ම යෝග්‍ය තැනක් වියයුතුයි. බොහෝ රටවල් අයැදුම්කරති. එහෙත් ඒ අවශ්‍ය සුදුසුකම් තිබෙනවා දැයි ඒ රටට ගොස් පරීක්ෂාකර බලා තීරණයක් ගන්නේ ඔලිම්පික් කමිටුවයි.

2008 දී චීනයේ බේජිං නුවර මෙයට කලින් ඔලිම්පික් ක්‍රීඩා පැවති තැනයි. එහෙත් ලන්ඩනය අයැදුම්කර සිටියේ 2005 ටත් කලිනි. රාජ්‍ය මට්ට-මෙන්ද, තානාපති මට්ටමෙන්ද, නොයෙක් නූල් සූත්තර යොදමින් එවකට පැවති රජයේ අගමැති ඇතුළු මැති ඇමතිවරු ඔලිම්පික් සිහිනය සබැකර ගන්නට හැකි සෑම වෙරවීරියක්ම දැරුවෝය. ඔලිම්පික් එංගලන්ත යට දෙනවායයි කමිටුවෙන් වචන පිටවනතුරු ගසන් නට ඇති සියළු තුරුම්පු ගැසූහ. ස්ථානය තීරණය

4 වන පිටුවට →




Roaring success : Britain's David Weir screams as he crosses the line in the 800m wheel-chair race for his third gold of the Paralympics.

බ්‍රිතාන්‍යයේ ඩේවිඩ් වියර් පැරලිම්පික් මීටර් 800 රෝදපුටු ධාවන තරඟය නිමා කරමින් දිනුම් තිරුවට ළඟාවෙද්දි මහා උද්දාමයෙන් හඬ නැගූ අයුරු.

නැති මු ත් දෙපා එය අඩුවක් නොවන ලෙද
දැඩි සි ත් යොදා ධාවන තරඟයක වැද
සැම නෙත් විස්මකර ජයගොස් ලබන සඳ
ඔ බ ඇ ත් තෙන්ම එළියක් විය ලොවට අද

No legs to stand or walk, let alone run a race,
But that did not stop you getting on a track
where only the fastest grace
Thousands roared and cheered, in utter dismay and delight
You were truly a giant flame that set the entire world alight!

♦ *දයා ආනන්ද රණසිංහ* ♦ *Daya Ananda Ranasinghe*


